ඉලුක්කේවෙළ ධම්මරතන හිමි,
ශාස්ත්‍රවේදී (ගෞරව), (බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය), ශාස්ත්‍රපති (පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි ආයතනය, කැලණිය), දර්ශනපති (පාලි හා බෞද්ධ පශ්චාද් උපාධි ආයතනය, කැලණිය)

# අඳුරට පහනක් වූ සූත්‍ර සාහිත්‍යයඃ ගාමිණි සංයුත්තය ඇසුරින් කෙරෙන අනාවරණයක්

ශබ්ද රසයෙන් අනූන, අර්ථ රසයෙන් අග්‍රගන්‍ය, සෞන්දර්යාත්මක සංසිද්ධීන්ගෙන් ඔපවත් ව ප්‍රඥාව ස්පර්ෂ කරන සාහිත්‍යයක් ලෙස බුදුසමයාගත සූත්‍ර සාහිත්‍යය හැඳින්විය හැකිය. ක්‍රි.පූ. 6වන සියවසෙහි පමණක් නොව 21වන සියවසෙහි ද රාගයෙන් ද්වේෂයෙන් හා මෝහයෙන් විපරීත වූ සමාජයට රාගවිනය, දෝසවිනය හා මෝහවිනය උදෙසා සපක්‍ෂවන සාහිත්‍යය බුදුසමයාගත සූත්‍ර සාහිත්‍යය යි. සූත්‍ර සාහිත්‍ය මූලය කොට ගනිමින් බිහි වූ සාහිත්‍ය කෘති සංඛ්‍යාත්මකව සුවිශාලය. බෞද්ධ දර්ශනයේ විවිධ පැතිකඩ මුල්කොට ගෙන ථෙරවාද, මහායාන, තන්ත්‍රයාන වශයෙන් ලොව පුරා ව්‍යාප්තව ඇති සාහිත්‍ය කෘති ගණනය කිරීමට මෙතෙක් කිසිවෙකුත් සමත් වී නැත. විටෙක සංස්ලේෂණ විශ්ලේෂණ න්‍යායයන් පදනම් කරගනිමින් බිහිවන අභිධර්මය වැනි ගැඹුරු ධර්ම කරුණු විග්‍රහ කරන ග්‍රන්ථයෝ ද තවත් විටෙක ඉතා ම රසවත් කථාන්දරයන්ගෙන් සුපෝෂිත ධම්මපදට්ඨ කථාව, පන්සිය පනස් ජාතක පොත, වැනි ග්‍රන්ථයෝ ද ඒ සියල්ල ඒකාරාශී කරමින් නිර්මාණය වන විශුද්ධිමාර්ගය වැනි හස්තසාර ග්‍රන්ථයෝ ද බෞද්ධ සාහිත්‍යයේ අපූර්වත්වය ස්ඵුට කරති. ගාථාවට, ගද්‍යයට පමණක් සීමා වූ බෞද්ධ සාහිත්‍ය ක්‍රමයෙන් විකාශය වී කවියටත්, ගීතයටත්, කෙටිකතාවට හා නවකතාවටත්, වර්තමානයේ දී චිත්‍රපටයට හා ටෙලිනාට්‍යයටත් නෑකම් කියයි. මේ සියල්ල නිර්මාණය වී ඇත්තේ සරාගී මනස විරාගී කොට ආනන්දයෙන් ප්‍රඥාව කරා සහෘදයන් රැගෙන යාමට ය.

නිර්මාණය කුමක් වුවත් එහි අන්තර්ගතය කෙසේ විය යුතු දැයි අභයරාජකුමාර සූත්‍රය පෙන්වා දෙයි. ''**තථාගතෝ තං වාචං යා සා වාචා පරෙසං අප්පියා අමනාපාති?**'' (ම.නි. ii, 96) යනුවෙන් තථාගතයන් වහන්සේ අන්අයගේ සිත් රිදවනවාද නැද්දැ'යි අභයරාජ කුමාරයා ඇසූ ප්‍රශ්නයට පටිපුච්ඡා ව්‍යාකරණීය ක්‍රමය භාවිත කරමින් බුදුන්වහන්සේ පිළිතුරු සැපයූහ. එහි දී ඕනෑම නිර්මාණයක සංයුතිය සඳහා අවශ්‍ය ගුණාංග පහක් පෙන්වා දුන්හ.

1. **භූතං** - ලොව පවත්නා යමක් විය යුතුය
2. **තච්ඡං** - ලොව පවත්නා සත්‍යයක් විය යුතුය
3. **අත්ථසංහිතං** - අර්ථය පිණිස විය යුතුය
4. **පරෙසං පියා මනාපා/ පරෙසෙං අප්පියා අමනාපා** - ප්‍රේක්‍ෂකයන්ට ප්‍රිය වූ ද මනාප වූ ද/ අප්‍රිය වූ ද අමනාප වූ ද විය යුතුය
5. **කාලඤ්ඤූ** - කාලයට අනුරූප විය යුතුය

බුදුන්වහන්සේ අන්අයගේ සිත් රිදවනවාද නැද්ද යන ප්‍රශ්නයට පිළිතුරු ලෙස අංක 1, 2, 3, හා 5 යටතේ එන කරුණු පමණක් ප්‍රමාණවත් බව සඳහන් කළහ. අන්අයට එය ප්‍රිය වුවත් අප්‍රිය වුවත්, මානාප වුවත් අමනාප වුවත් උක්ත කරුණු හතර එහි අන්තර්ගතව ඇත්නම් හි එය ඊට සුදුසු

අවස්ථාව නම් උන්වහන්සේ එය ප්‍රකාශ කරන බව දේශනා කළහ. ඒ අනුව, බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර දේශනා අතුරෙන් වත්මන් සමාජයට අතිශය ප්‍රයෝජනවත් ධර්ම ගැටලු සාකච්ඡා කරන සංයුත්තයකි සංයුත්ත නිකායේ එන ගාමිණී සංයුත්තය. එහි එන සූත්‍ර කිහිපයක් ගුරු කොට ගනිමින් අඳුරෙන් මිදී ආලෝකයට එන්නට වෙර දරන්නන්හට සූත්‍ර සාහිත්‍යයෙන් ලබා ගත හැකි සහයෝගය පෙන්වා දී ඒ පිළිබඳ උනන්දුව ඇති කිරීම මෙම ලිපියේ අරමුණයි.

චණ්ඩගාමිණී සූත්‍රයේ දී පුද්ගලයෙකු කවර හේතු නිසා චණ්ඩියෙකු වන්නේ දැයි චණ්ඩගාමිණී විමසයි.

> **කො නු ඛො භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චො චණ්ඩො තෙව සඞ්ඛං ගච්ඡති? කො පන භන්තෙ හෙතු කො පච්චයො යෙන මිධෙකච්චො සොරතො තෙව සඞ්ඛං ගච්ඡති?** (සං.නි. iv, 556)

යමෙක් සැඩ යැයි කීමට හේතුව කුමක් ද? ප්‍රත්‍යය කුමක් ද? යමෙක් මොලොක් යැයි කීමට හේතුව කුමක් ද? ප්‍රත්‍යය කුමක් ද? වශයෙන් ඔහු ප්‍රශ්න කරයි.

එයට පිළිතුරු ලෙස බුදුරජාණන් වහන්සේ, යමෙකුගේ රාගය ප්‍රහීන නොවූ හෙයින් හෙතෙම අන් අය කෝපයට පත් කරවන බවත්, අනුන් තමන්ව කෝපයට පත් කරන විට තමා කෝපයට පත්වන බවත්, එවිට ඔහු සැඩ අයෙකු යැයි සැලකෙන බවත් පෙන්වා වදාළහ. එසේම, දෝසය හා මෝහය හේතු කොට ගෙන ද යමෙක් සැඩ බවට පත්වන්නේ යැයි මෙහි දී විස්තර වෙයි.

රාගය ප්‍රහීන වූ අයෙක් අන් අය කෝපයට පත් නො කරන බවත්, අන් අය තමාව කෝපයට පත් කරන විට තමන් කෝපයට පත් නොවන බවත්, එවිට ඔහු මොළොක් අයෙකු යැයි සැලකෙන බවත් පැහැදිලි කරයි. තවද දෝසය හා මෝහය ප්‍රහීන වූ විට ද අයෙක් මොළොක් වන බව දක්වයි.

වර්තමාන සිනමා කලාව පිළිබඳ විශේෂයෙන් සලකා බැලීමේ දී අවධානය කළ යුතු කරුණක් පිළිබඳ ව තාලපුට සූත්‍රය කරුණු අනාවරණය කරයි.

> **සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උප්පජ්ජතී ති. ඉධ භගවා කිමාහාති?** (සං.නි. iv, 558)

''යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද ඇත්තෙන් හා බොරුවෙන් ප්‍රේක්ෂකයන් සතුටු කරවයි ද ඇලුම් කරවයි ද ඔහු මරණින් මතු පහාස දෙවියන් සමීපයට යන්නේ ය.'' යන්න තාලපුට විසින් ඇජර පැජර නළුවන් කියද්දී අසන ලද්ද කි. එකරුණ පිළිබඳ ව භාග්‍යවතුන් වහන්සේගේ අදහස කුමක් දැ'යි තාලපුට ප්‍රශ්න කරයි. තාලපුට මෙකී සිනමා කලාවට දායකත්වය දක්වන පුද්ගලයෙකු වන හෙයින් ඊට පිළිතුරු සැපයීම පළමුව ද දෙවනුව ද ප්‍රතික්ෂේප කළහ. නමුත් ඔහුගේ බලවත් ඉල්ලීම හේතු කොට ගෙන තෙවැනි වර ඊට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ, ප්‍රේක්ෂකයන් තුළ පවත්නා පහ නොවූ රාගය ඉස්මතු වීම පිණිස නළුවන්ගේ සරාගී රැගුම් ද දොසය ඉස්මතු

වීම පිණිස දොස සහගත රැගුම් ද මෝහය ඉස්මතු වීම පිණිස මෝහ සහගත රැගුම් ද හේතු වන බව දේශනා කළහ. එසේම, ඔවුහු මරණින් මතු නිරයෙහි හෝ තිරිසන් අපායෙහි හෝ උපදින බව ද දේශනා කළහ.

මින් පැහැදිලි වන්නේ කලාව හේතු කොට ගෙන සහෘද හදවත් රාගයෙන්, ද්වේශයෙන් හා මෝහයෙන් අවදිකරයි නම්, ඉන් මුළු මහත් සමාජය ම රාගාදික ද්වේශාදික මෝහාදික වීම කිසිසේත් නවතාලිය නොහැකි බවයි. රාගය, ද්වේශය හා මෝහය පිණිස හේතු වන ඕනෑම දෙයක් ඉතා පහසුවෙන් සහ වේගයෙන් සමාජගත වන නමුත් රාගවිනය, දෝසවිනය හා මෝහවිනය සඳහා හේතුවන නිර්මාණ එතරම් පහසුවෙන් සමාජගත නොවූවත් මූල්‍යමය වශයෙන් විශාල ලාභයක් ලැබිය නොහැකි වුවත් ඉන් ගොඩනැගෙන සමාජය ඉතා යහපත් ය.

රට, දැය, සමය යනු මිනිසාගේ ලේ, මස්, ඇට, ඇටමිදුළු දක්වා ම කාවැදුණු ඉතා සංවේදී කරුණු ය. මේ පිළිබඳ මතවාද ගොඩ නැගීම, තම අයිතීන් වෙනුවෙන් සටන් කිරීම, යුධ වැදීම මිනිස් සංහතියේ ම විනාශයට හේතුවකි.

තම අයිතීන් වෙනුවෙන් සටන් වැදුණු යුධ සෙබළෙක් වන යෝධාජීව ගාමිණී හා බුදුරජාණන් වහන්සේ අතර ඇතිවන සංවාදයකි යෝධාජීව සූත්‍රය.

> **සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරිය පාචරියානං යොධාජීවානං භාසමානානං යො සො යොධාජීවො සඞ්ගාමෙ උස්සහති වායමති, තමෙනං උස්සහන්තං වායමන්තං පරෙ හනන්ති පරියාපාදෙන්ති, සො කායස්ස භෙදා පරම්මරණා සරඤ්ජිතානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති, ඉධ භගවා කිමාහාති** (සං.නි. iv,562).

''යම් යුධ සෙබලෙක් යුද්ධයෙහි උත්සාහ කරයි ද වෑයම් කරයි ද ඔහු උත්සාහයෙන් වෑයමෙන් සතුරන් නසයි. මරණයට පත් කරයි. ඔහු මරණින් මතු සරඤ්ජිත දෙවියන්ගේ සභාවයට පැමිණේ ය'' යැයි මා විසින් පෙර විසූ යුධ සෙබළුන්ගෙන් අසන අසන ලදී. මේ පිළිබඳ භාග්‍යවතුන් වහන්සේ කුමක් දේශනා කරන සේක් දැයි යෝධාජීව ගාමිණී බුදුරජාණන් වහන්සේගෙන් විමසයි.

පළමු, දෙවන අවස්ථාවන් හි දී බුදුරජාණන් වහන්සේ ඊට පිළිතුරු දීමට මැලි විය. නමුත් තෙවැනි වර කරන ලද ඉල්ලීමට අනුව ඊට පිළිතුරු දුන් බුදුරජාණන් වහන්සේ, ''යම් ඒ යුධ සෙබළෙක් යුද්ධයෙහි දී මේ සත්ත්වයෝ ''නැසෙත්වා හෝ බැඳෙත්වා හෝ සිඳෙත්වා හෝ වැනසෙත්වා හෝ'' යැයි උත්සාහ කෙරේ ද වෑයම් කෙරේ ද ඔහුගේ සිත පළමුව ලාමකය ය, නපුරු ය, වරදවා පිහිටුවන ලද්දේ ය. එසේ උත්සාහ කරන, වෑයම් කරන, ඔහු සතුරන් මරණත් නම්, හෙතෙම මරණින් මතු නිරයෙහි හෝ තිරිසන් යෝනියෙහි හෝ උපදින්නේ ය'' යැයි දේශනා කළහ.

ඇතැම් ආගමික පූජකයන් තම ආගම ආරක්ෂා කරගැනීම සඳහාත් ස්වකීය පැවැත්ම සඳහාත් මිත්‍යාදෘෂ්ටිගතව කටයුතු කරයි. මිනිසුන් මුලා කරමින් වාසය කරන එවැනි පූජකයන්ගේ ක්‍රියාකාරකම් විවේචනය කරන සූත්‍රයකි අසිබන්ධක සූත්‍රය.

> **බ්‍රාහ්මණා භන්තෙ පච්ඡාභූමකා කාමණ්ඩලුකා සෙවාලමාලිකා උදකො රොහකා අග්ගිපරිචාරකා තෙ මතං කාලකතං උය්‍යාපෙන්ති නාම සඤ්ඤාපෙන්ති නාම සග්ගං නාම ඔක්කාමෙන්ති. භගවා පන භන්තෙ අරහං සම්මාසම්බුද්ධො**

> **පහොති තථා කාතුං යථා සබ්බො ලොකො කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජෙය්‍යාති** (සං.නි. iv, 566).

බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි අසිබන්ධක ගාමිණී උන්වහන්සේගෙන් මෙසේ විමසයි. ''භාග්‍යවතුන් වහන්ස, පච්චාභූමීහි වාසය කරන, කෙණ්ඩි දරන, සෙවෙල් මාලා ඇති දියට බැසින, ගිනි පුදන, ඒ බමුණන් විසින් මළහු, කලුරිය කළහු උඩට, දෙව්ලොවට යවනු ලැබේ. භාග්‍යවතුන් වහන්සේට යම් සේ මේ සියලු ලෝකයා මරණින් මතු සුගතියට, දෙව්ලොට පැමිණවිය හැකි වෙත් ද?''

බුදුරජාණන් වහන්සේ මීට පිළිතුරු සපයමින් දේශනා කළේ ගාමිණී, යම් හෙයකින් පුරුෂයෙක් මහ ගලක් ගෙන එය ගැඹුරු දියවිලක බහා මහජන සමූහයා රැස් කරවා එම්බා ගල මතු වෙව, එම්බා ගල පාවෙව, එම්බා ගල ගොඩ නැගෙව යැ'යි යදින්නේ, අතැගිලි බැඳ පැදකුණු කරන්නේ ඒ ගල මතුවීම හෝ පාවීම හෝ ගොඩ ඒම හෝ සිදුවන්නේ දැයි ඇසීය. ඊට පිළිතුරු දෙමින් අසිබන්ධක ගාමිණී පැවසූයේ, ''වහන්ස, එය නොවේ'' යනුවෙනි.

එමෙන් ම යම් පුරුෂයෙක් දුෂ්චරිතයන් සිදු කොට මිත්‍යාදෘෂ්ටිගතව මරණයට පත් වූ විට ''මේ පුරිස් තෙමේ මරණින් මතු සුගතියට පැමිණේත්වා'' යි යැදීම, පැදකුණු කිරීම, කළ ද ඔහු නිරයට යාම වැළැක්විය නොහැකි බව ද බුදුන් වහන්සේ පෙන්වා වදාළහ.

බුදුරජාණන් වහන්සේ මහාකාරුණිකයාණන් වහන්සේ ය. උන්වහන්සේගේ මහාකරුණාව ප්‍රශ්න කෙරෙන තවත් එක් අවස්ථාවකි අසිබන්ධකපුත්ත ගාමිණී සූත්‍රය.

> **නනු භන්තෙ භගවා සබ්බපාණභූතහිතානුකම්පී විහරතී ති. එවං ගාමිණී තථාගතො සබ්බපාණභූතහිතානුකම්පී විහරතී ති. අථ කිඤ්චරහි භන්තෙ භගවා එකච්චං සක්කච්චං ධම්මං දෙසෙතීති, ඒකච්චං නො තථා සක්කච්චං ධම්මං දෙසෙතීති. තෙන හි ගාමිණී, තං යෙවෙත්ථ පටිපුච්ඡිස්සාමි** (සං.නි. iv, 570).

අසිබන්ධකපුත්ත ගාමිණී බුදුරජාණන් වහන්සේගෙන් මෙසේ ප්‍රශ්න කරයි. වහන්ස, භාග්‍යවතුන් වහන්සේ සියලු සතුන් කෙරහි හිතානුකම්පා ඇති ව වැඩවෙසන සේක් නොවේ ද? ගාමිණී, එසේ ය. තථාගත තෙමේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇති ව වෙසෙයි. වහන්ස, එසේ නම් කුමක් හෙයින් භාග්‍යවතුන් වහන්සේ ඇතැමුන්ට සකසා දහම් දෙසන සේක් ද, ඇතැමුන්ට එසේ සකසා දහම් නො දෙසන සේක් ද? තථාගතයන් වහන්සේ ප්‍රතිප්‍රශ්න නගමින් මෙසේ පිළිතුරු දුන්හ.

යම් ගොවියෙකුට කුඹුරු තුනක් ඇත. එකක් අග්‍රය, අනෙක මධ්‍යම ය, අනෙක නිසරු ය. වී වපුරණු කැමති ගොවියා ප්‍රථමයෙන් වපුරන්නේ කුමන කුඹුර දැයි ඇසීය. එවිට ගාමිණී අග්‍ර වූ කුඹුර යැයි පිළිතුරු දුන්නේය. දෙවනුව මධ්‍යම වූ කෙත ද වපුරයි. තෙවනුව, ගවයන් ආදීන්ගේ පරිභෝජනය සඳහා නිසරු කෙත ද වපුරන්නේ යැයි පිළිතුරු දුන්නේය.

එය විග්‍රහ කරමින් ගාමිණී, මට ද මහණ මෙහෙණහු අග්‍ර වූ කුඹුර බඳුය, උවසු උවැසියෝ මධ්‍යම කුඹුර බඳුය, අන්‍ය මහණ බමුණෝ නිසරු කුඹුරු වැනියැ'යි බුදුන්වහන්සේ පැවසූහ.

සසර සැරිසරන සත්වයන් විවිධ ආත්මභාව ලබමින් කර්මානුරූපීව හීන ප්‍රණීත වශයෙන් උප්පත්තිය ලබන බව චූළකම්මවිභංග සූත්‍රයෙහි (ම.නි. iii, 432- 442) විග්‍රහ වෙයි. කරුණු හයක් මුල් කරගනිමින් එහි දීර්ඝ ලෙස සාකච්ඡා කොට ඇත. නමුත්, මහාකම්මවිභංග සූත්‍රයෙහි (ම.නි. iii, 444-456) කර්ම විපාක දීමේ දී යම් යම් සීමාවන් පවතින බවත්, ලෝණඵල සූත්‍රයේ දී මහා කර්මයන් හේතුවෙන් සුළු කර්ම යටපත් වන ආකාරයත් (අං.නි. i, 444) විවරණය කරයි. මේ ආදී විග්‍රහයන් පිළිබඳ අවධානය යොමු කරන පාඨකයා / ශ්‍රාවකයා ඇතැම් විටෙක මංමුළා වෙයි. මෙලෙස යම් විග්‍රහයක් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා නොගැනීම හේතුවෙන් දූර්මත ඉදිරිපත් වීම අසාමාන්‍ය නොවූවකි. එවන් දූර්මතධාරීන් සඳහා ම වූ කර්මය පිළිබඳ විවරණයක් සඞ්ඛධම සූත්‍රයේ දී හමුවේ.

නිගණ්ඨනාථපුත්තයන් වහන්සේගේ ශ්‍රාවකයෙකු වූ අසිබන්ධකපුත්ත ගාමිණී බුදුරජාණන් වහන්සේ වෙත පැමිණ ධර්ම සාකච්ඡාවක නිරත වෙයි. මෙය එහි දී ඇති වූ සංවාදයකි.

නිගණ්ඨනාථපුත්ත ශ්‍රාවයන්ට කෙසේ දහම් දෙසත් දැයි බුදුන් වහන්සේ විචාළ හ. ඊට පිළිතුරු වශයෙන් අසිබන්ධකපුත්ත ගාමිණී සඳහන් කළේ යමෙක් යම් අයපත් ක්‍රියාවක වැඩි වැඩියෙන් නිරත වෙයි නම් හෙතෙම නිරයට පමුණුවන බවයි (ම.නි. ii, 576). බුදුරජාණන් වහන්සේ මෙය විචාරයට ලක්කරමින් පෙන්වා දුන්නේ ඒ හේතු කොට ගෙන කිසිවෙකුත් අපායට නොයන බවයි. මක්නිසාද යත් යමෙක් පරපණ නසත් නම් හෙතෙම එහි නිරත වන්නේ දිවා කාලයෙහි ද නැතහොත් රාත්‍රී කාලයෙහි දැයි විමසන විට ඔහු පරපණ නැසීමෙන් තොරව කටයුතු කරන කාලය ඉතා වැඩි වන හෙයිනි.

''කිසිවෙක් පරපණ නසත් ද ඒ සියල්ලෝ නිරයට අපායට යන්නෝ'' ය යනුවෙන් යම් ශාස්තෘවරයෙක් උගන්වත් නම් එම ඉගැන්වීම අනුව ගිය ශ්‍රාවකයා ඒ නිමිති කොට ගෙන ම අපායගාමී වෙයි. මක්නිසාදයත්, ඔහු විසින් සිදුකරන ලද වරද නිරතුරු සිහිකිරීමත්, එය ස්වකීය ගුරුවරයාගේ ඉගැන්වීම අනුව අපායගාමී වීම සඳහා හේතුවන බව පිළිගැනීමත් නිමිතිකරගෙන, හෙතෙම එම සිතුවිල්ලෙන් මරණයට පත් ව අපායෙහි උප්පත්තිය ලබන හෙයිනි. ඒ අනුව, ඔහු විසින් ස්වකීය ජීවිත කාලය තුළ සිදු කළ යහපත් ක්‍රියා හේතුවෙන් ලැබිය යුතු ඵල ආවරණය වන බවත් පෙන්වා දුන්හ (ම.නි. ii, 578).

තථාගතයන් වහන්සේ නන් අයුරින් ප්‍රාණඝාතා දී පාපී ක්‍රියා ගරහත්, ඉන් වළකින ලෙස දහම් දෙසත්. එය නුවණින් සලකන ශ්‍රාවකයා පවින් මිදෙයි, පව් ප්‍රහාණය කරයි ''**සො ඉති පටිවිරතො හොතිඃ එවමෙතස්ස පාපස්ස කම්මස්ස පහානං හොති**'' (ම.නි. ii, 580). මෙසේ කටයුතු කරන ශ්‍රවකයාගේ දැඩි ලෝභය පහව ගියේ (විගතාභිජ්ඣො) ව්‍යාපාදය පහව ගියේ (විගතව්‍යාපාදො), නොමුළා වූයේ (අසම්මූළ්හෝ) මනා දැනුම් ඇත්තේ (සම්පජානො) වෙයි. මෙසේ, ඔහු ආර්යශ්‍රාවකයෙකු බවට පත් වෙයි (ම.නි. ii, 582).

වර්තමාන සමාජය තුළ නිරන්තරයෙන් උද්ගතවන ගැටලු රාශියකට පිළිතුරු ලබා දෙන සංයුක්තයක් වශයෙන් ගාමිණී සංයුත්තය වැදගත් වන බව උක්ත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීමෙන් මනාව පැහැදිලි වේ. ඒ අනුව, බෞද්ධ සූත්‍ර සාහිත්‍යයෙහි එන ධර්ම විග්‍රහයන් අනුව

යමින් වර්තමාන කෙටිකතාවට, වනකතාවට, ගීතයට, ටෙලි නාට්‍යයට හා චිත්‍රපටයට සමාජ සුබසිද්ධිය සඳහා සුවිශේෂී සේවාවක් ඉටු කළ හැකි බව ඉතා පැහැදිලි ය.

**ආශ්‍රේය ග්‍රන්ථ**

**ප්‍රාථමික මූලාශ්‍ර**


<u>අංගුත්තර නිකාය</u> (Vol. i). (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. PDF

<u>මජ්ඣිම නිකාය</u> (Vol. ii). (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. PDF

<u>මජ්ඣිම නිකාය</u> (Vol. iii). (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. PDF

<u>සංයුත්ත නිකාය</u> (Vol. iv). (2006). බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා. PDF


**පරිගණක මෘදුකාංග**


*Chaṭṭha Saṅgāyana Tipiṭaka* 4.0. (1995). Vipassana Research Institute.